මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2024

# සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය : ........................ නම : ........................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 යි. |
|---|---|---|

Learning Resource Center
R
De Mazenod College
Kandana

උපදෙස්

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

* අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. විමල් **ඉළමොළ** ගති ඇති තරුණයකු බව ඔහුගේ මිතුරෝ පවසති.
   (1) සටකපට (2) නොහික්මුණු (3) නුවණැති (4) වංචා සහගත

2. විරැකියාවෙන් පීඩාවට පත් තරුණයෝ රැකියා සොයමින් **හද්දිග්බාගේ** ඇවිදිති.
   (1) පිටරටවල (2) සියලු නගරවල (3) හැම අතක ම (4) බොහෝ දුරක්

3. "කියන දෙය **වහෙන් ඔරෝ** නොකියා කෙළින් කියන්නැ"යි ආයතන හිමියා සේවකයන්ට පැවසී ය.
   (1) සැක සහිත ලෙස (2) අනවශ්‍ය විස්තරවලින් තොරව
   (3) තොරතුරු සඟවමින් (4) ව්‍යංග්‍යයෙන්

* අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. කතුවැකියේ දී ........................ මාතෘකාව ආශ්‍රයෙන් බොහෝ විට කරුණු ඉදිරිපත් කෙරෙන්නේ මධ්‍යස්ථ ආකාරයෙනි.
   (1) ප්‍රස්තුත (2) ප්‍රබුද්ධ (3) ප්‍රසිද්ධ (4) ප්‍රවීණ

5. කන්නන්ගර මහතා තම මවු පාසල වූ රිච්මන්ඩ් විද්‍යාලයෙහි ම ගණිතය පිළිබඳ ගුරුවරයකු ලෙස වෘත්තීය ජීවිතයට ........................ විය.
   (1) ප්‍රතික්ෂේප (2) නිරාවරණය (3) නිරීක්ෂණය (4) ප්‍රවිෂ්ට

6. කවියෝ තම නිර්මාණ සඳහා භාෂාවේ විවිධ ස්වරූප ........................ කර ගනිමින් කාව්‍යෝක්ති නිර්මාණය කර ගනිති.
   (1) සුසංයෝජනය (2) ප්‍රහර්ෂය (3) සංකලනය (4) සංවර්ධනය

7. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) කාව්‍යශේඛරය, ගුත්තිලය, සසදාවත, රන්රෝස
   (2) බුත්සරණ, ධර්මප්‍රදීපිකාව, සද්ධර්මරත්නාවලිය, ලෝවැඩ සඟරාව
   (3) ගිරා, මයුර, සැළලිහිණි, හංස
   (4) කුණාටුව, කම්මුතු, සුභාෂිතය, සංවාදය

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ලේඛණ, ප්‍රතිඵල, වර්ධනය, කොට්ඨාශ (2) විශිෂ්ඨ, ආශ්වාද, සමස්ථ, සම්ප්‍රදාන
(3) නිදර්ශන, විස්මය, කනිෂ්ඨ, මර්දනය (4) සම්ප්‍රදාන, ස්පන්දන, කාක්ෂණය, අර්බුධ

9. කොම්බුව හා ගයනුකිත්ත, කෙටි පාපිල්ල, කෙටි ඇදය, දීර්ඝ ඉස්පිල්ල සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පේළිය තෝරන්න.
(1) නෞකාව, රුවල, කැටය, මීරිගම (2) ගෞතම, නුවර, රුපියල, වීණාව
(3) යන්ත්‍රය, කුඩය, මැස්ස, කේතලය (4) භෞතික, සාවද්‍ය, දැල, පෝරුව

10. 'ගමන' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) කණ්ඨජ, ඕෂ්ඨජ හා තාලුජ (2) කණ්ඨජ, ඕෂ්ඨජ හා දන්තජ
(3) ඕෂ්ඨජ, දන්තජ හා මූර්ධජ (4) දන්තජ, ඕෂ්ඨජ හා තාලුජ

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අප, ඔවුන්, කුරුල්ලෝ, මගියෙක් (2) බල්ලෙක්, මවක්, මිනිසුන්, දෙවියකු
(3) වනිතාවක්, තොප, පියාණෝ, ගොවියකු (4) කාන්තාවක, මා, දරුවන්, ගොනකු

12. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද.
(1) කණ්ඨජ වේ. (2) මූර්ධජ වේ. (3) තාලුජ වේ. (4) දන්තජ වේ.

13. මුලින් දී ඇති ක්‍රියා ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) විධි ක්‍රියා - නටනු, දෙන්න, යව, බල
(2) මිශ්‍ර ක්‍රියා - නටනටා, ගයමින්, දුවමින්, ලියලියා
(3) අසම්භාව්‍ය ක්‍රියා - කියද්දී, වැස්සොත්, කළොත්, කරවයි
(4) පූර්ව ක්‍රියා - නටා, ගයා, කා, උයා

* 14 හා 15 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට බහු අර්ථයක් නොදෙන පදය තෝරන්න.

14. වක - (1) සඳ (2) කථාව (3) මුහුණ (4) වස්ත්‍රය

15. නා - (1) ඇතා (2) නාගයා (3) නාගස (4) නළල

16. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සූර්යයා - දිනකර, දිනමිණ, රිවි, රවිඳු (2) චන්ද්‍රයා - සිසි, හිමකර, කරිඳු, තාරපති
(3) ඇස - නෙත, නයන, නුවන, අක්ෂි (4) ආලෝකය - එළිය, අලු, තිමිර, පහන්

17. විරුද්ධාර්ථ පද යුගලයක් ඇති වරණය තෝරන්න.
(1) ආධුනික - නව (2) සරල - පහසු (3) ජංගම - ස්ථාවර (4) උතුම් - වර

* 18 සිට 20 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

18. කවිත්වය, ප්‍රගුණ වන්නේ සතතාභ්‍යාසයෙනි.
(1) පොතපත කියවීමෙනි. (2) සියලු අභ්‍යාසවල යෙදීමෙනි.
(3) නිරතුරුව පුරුදු පුහුණු කිරීමෙනි. (4) ක්‍රීඩා කිරීමෙනි.

19. සිංහල භාෂාව රසවත් ඇමතුමෙන් හා ජනකාන්ත භාවයෙන් පරිපූර්ණ ය.
(1) ජනයා ඇද ගන්නා බව (2) ජනයා බැබළවීමට සමත්
(3) ජනයා අතර ජනප්‍රිය (4) ජනයාට ලැදි.

REGISTRAR
... College
Kandana

20. ඔහුගේ සිතෙහි ඇති වූ ප්‍රහර්ෂය අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් තුළ ගන්වයි.
(1) කනගාටුව (2) කලකිරීම (3) අධික සන්තෝෂය (4) පැහැදීම

21. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.
(1) අකුරු, වචන, වාක්‍ය, ඡේදය (2) දන්තජ, තාලුජ, මූර්ධජ, ස්වර
(3) පැන, පැන්සල, මකනය, පොත (4) ඇවිදීම, ඉගිලීම, පිහිනීම, පැනීම

22. ක්‍රියා විශේෂණ පදයක් නොවන පිළිතුර තෝරන්න.
(1) වේගයෙන් (2) සතුටින් (3) පරිස්සමෙන් (4) සුවිශේෂ

23. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) නිපාත - සමග, විසින්, හනික, ඊයේ (2) උපසර්ග - අපිරිසිදු, උපදෙස්, කබල, ප්‍රබල
(3) කෘදන්ත - නැටිලි, බලන, දුවන්නී, ගැයූ (4) තද්ධිත - රසායනික, රූමත්, ගුණවත්, සෙල්මුවා

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'සමහරු' යන්න නිත්‍ය බහුවචන පදයකි. (2) ඌෂ්මාක්ෂර, සර්ෂ නමින් ද හඳුන්වයි.
(3) අක්ෂර මාලාවේ අර්ධ ස්වර 18 කි. (4) 'ඪ' මූර්ධජ අක්ෂරයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය කුමක් ද ?
(1) තමාගේ සිත සසල කළ අත්දැකීමක් ප්‍රකාශ කිරීම අන්‍යයන්ට නිර්මාණකරුවකුගේ අභිලාෂය යි.
(2) තමාගේ සසල කළ සිත අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම නිර්මාණකරුවකුගේ අභිලාෂය යි.
(3) තමාගේ සිත සසල කළ නිර්මාණකරුවකුගේ අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම අභිලාෂය යි.
(4) තමාගේ සිත සසල කළ අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම නිර්මාණකරුවකුගේ අභිලාෂය යි.

26. රූපකයක් සහිත වරණය තෝරන්න.
(1) "අද නම් නුවරඑළියකි මා වෙසෙන ගම" (2) "ගැඹ වුණ සිසිල එයි ඊතල පරිදි මෙහේ"
(3) "පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දාරා" (4) "සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි"

* අංක 27, 28 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

27. අරමුණකින් තොරව වැඩ කිරීම.
(1) අතු කඩා මොරකන්නා සේ (2) කළුවා මාරපන් ගියා වගේ
(3) කැලේට පායපු හඳ වගේ (4) වක්කඩේ හකුරු හැංගුවා වගේ

28. කෙනෙකුගේ යථා ස්වරූපය පෙනෙන්නේ ඔහුගේ ක්‍රියා කලාපයෙනි.
(1) පුහුල් හොරා කරෙන් දැනේ (2) පුංචි අම්මාක් ඇවිත් කැවුම් පුංචි කළා වගේ
(3) කණ කොකාගේ සුදු පෙනෙන්නේ ඉගිලෙන වීට ලු (4) උඹරෝ තවද ද තහ කැවේ ?

* අංක 29 සිට 31 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) එක් අයෙක් ගී ගයති. (2) අප සමගි දම් රකිය යුත්තෙමු.
(3) ළමයි ගී ගයද්දී ගුරුතුමිය පන්තියට ආවා ය. (4) කම්කරුවෝ තුන් දෙනෙක් පාරේ වැඩ කරති.

30. (1) පාසල් සිසුන් ගුරු උපදෙස් පිළිපැදිය යුතු ය. (2) තාරකාවෝ අහසේ බබළයි.
(3) ඇතැමෙක් ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරයි. (4) ඔවුහු එය වටහා ගැනීම යෙහෙකි.

31. (1) ඔ තොමෝ මල් කඩා බුදුන් වැන්දේ ය. (2) මම එම පොත කියවා ඇත්තෙමි.
(3) දරුවෝ අකීකරු වන්නේ ඇයි ? (4) අපි අසරණයන්ට පිහිට වීම වටී.

32. 'දියවර මංගල්‍යය' යනු,
(1) වැසි ජලය ප්‍රථමවරට වැවකට ලැබීම.
(2) වැවකින් ගොවිතැන සඳහා පළමු වරට ජලය නිකුත් කිරීම.
(3) ගොවි බිමට ජලය ලබා දීම නතර කිරීම.
(4) සුබ නැකතකින් වැවට ජලය ලබා දීම.

33. 'අපි ඉස්සර හිටියෙ කුරුණෑගල'
'වරෙල්ලා, ආයෙත් තල්ලු කරමු'
'අපි වහාම මෙය වෙනස් කළ යුතු වෙමු'
'මං තවත් නම් පෙත්සම් ලියන්නේ නැහැ'
ඉහත අවස්ථා උපුටාගත් පාඩම් මාතෘකා නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) තොරොක්කෝව, මං තනන්නෝ, ආචාර්ය ටී. බී. ජායා, පුවත්පත් විශේෂාංග ලිපි
(2) ආචාර්ය ටී. බී. ජායා, මං තනන්නෝ, තොරොක්කෝව, පුවත්පත් විශේෂාංග ලිපි
(3) ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර, මං තනන්නෝ, තොරොක්කෝව, ආචාර්ය ටී. බී. ජායා
(4) මං තනන්නෝ, තොරොක්කෝව, ආචාර්ය ටී. බී. ජායා, පුවත්පත් විශේෂාංග ලිපි

34. මහගම සේකරයන්ගේ නිර්මාණයක් නොවන්නේ,
(1) රත්නදීප ජන්ම භූමි කාව්‍ය නිර්මාණය (2) සදා මෙලෙස පුර දෙරණේ
(3) සක්වාලිහිණි (4) මං තනන්නෝ

35. පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.
වලාකුළේ රන් පාටට විදුලි කොටනවා
ආකාසෙ හඬ කළඹින් අකුණු හඬනවා
.......................................................
ගෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා
(1) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා (2) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා
(3) බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා (4) වහිනවා වහිනවා වහිනවා වහිනවා

36. මුල් පදයේ අර්ථයක් ඇති දෙවන පදයේ අර්ථයක් නැති යුගල පද සහිත වරණය තෝරන්න.
(1) වාදභේද, යානවාහන, තක්කුමුක්කු, වංහුං (2) අකාමකා, මළඉලව්, උයාපිහා, කැඩුම්බිඳුම්
(3) ළමයිබමයි, ඉඩම්කඩම්, උදව්පදව්, තරහමරහ (4) ලව්වලොව්ව, ආතබූත, කෙළිසෙල්ලම්, ආටකතාටක

37. 'උඹල මගේ දරුවො' කිව්වලු සාර්කුමා' මෙම ප්‍රකාශය කරන ලද්දේ,
(1) සයිමන් විසින් (2) අසඩක් විසින් (3) ගෘෂා විසින් (4) නටාලියා විසින්

38. මොනරාගල ප්‍රදේශයේ 'පුහුල්' යන්නෙන් හඳුන්වන්නේ,
(1) ගස්ලබු ය. (2) කිරිඅල ය. (3) පොල් ය. (4) වට්ටක්කා ය.

39. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.
'අපි කතා කළාම සමහර අය හිනා වුණා.'
(1) අප කතා කළ විට සමහරු සිනාසුණහ. (2) අපි කතා කළ විට සමහරෙක් සිනාසුණේ ය.
(3) අප කතා කළ විට සමහරුන් සිනාසුණහ. (4) අපි කතා කළ විට සමහරු සිනාසුණහ.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.
'ඇතැම් විට තමා උපන් භූමිය පමණක් නොව, හැදෙන වැඩෙන දේශය පිළිබඳව ද කෙනෙකු තුළ දේශානුරාගයක් ඇති විය හැකි ය.'
(1) තමා හැදෙන වැඩෙන භූමිය පිළිබඳව පමණක් දේශානුරාගය ඇති වේ.
(2) දේශානුරාගය, තමා උපන් භූමිය පිළිබඳව පමණක් නොව හැදෙන වැඩෙන දේශය පිළිබඳව ද ඇති විය හැකි ය.
(3) තමා උපන් භූමිය පිළිබඳව දේශානුරාගය ඇති වේ.
(4) දේශානුරාගය ඇති වීමට නම් තමා උපන් භූමිය පිළිබඳව ආදරයක් ලෙන්ගතුකමක් තිබිය යුතු ය.

2024.09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024

## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය: ................ නම: ................

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02 යි. |
|---|---|---|

Learning Resource Centre
De Mazenod College
Kandana

උපදෙස්
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) අබ (ආ) අඹ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

● "ලක් දෙරණ ආක්‍රමණිකයන්ගේ ග්‍රහනයෙන් මුදවා ගැනීමට තම ධනඳිය පමණක් නොව රුධිරය ද හෙලුවෝ බොහෝ වෙති."

(iii) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ශීල (ආ) අභ්‍යන්තර

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) මැනවින් පුරුදු පුහුණු බව

(ආ) කැඩී බිඳී ගිය යමක් නැවත සකස් කිරීම

(v) පහත සඳහන් පාඨයේ ඇතුළත් නිපාත පද දෙකක් උපුටා දක්වන්න.

★ ගොවිතැන සමග අත්‍යන්තයෙන් ම බැඳුණු අනෙක් මහාර්ඝ නිර්මාණය නම් වැව යි.

(vi) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට ද කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට ද හරවන්න.

(අ) ගත්කතුවරු රසවත් ග්‍රන්ථ රචනා කරති.

(ආ) සොරුන් විසින් ළමයෙක් පැහැර ගන්නා ලදී.

(vii) පහත සඳහන් වචන දෙකෙහි අනුක්ත රූප ලියන්න.

(අ) භික්ෂූහු (ආ) ගුරුවරියක්

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) ඔවුහු තුමූ රාජ්‍ය සේවයට ගියා ය.

(ආ) ගුරුවරු ඔවුහු සමග සාකච්ඡා කරති.

(ix) පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය ලියන්න.

(අ) මහල්ලා (ආ) ගොවියාට

(x) පහත සඳහන් වචනවල පොදු ව්‍යවහාර ලියන්න.

(අ) බක්කම්මං (ආ) ගහමච්චා

*(ලකුණු 20)*

02. පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමානයේ පාසල් සිසුන් කියවීමේ පුරුද්දෙන් බැහැර වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඒ සඳහා බලපාන සාධක ලෙස රූපවාහිනිය, පරිගණකය මෙන් ම ජංගම දුරකථනය ද බලපා ඇති බව විද්වතුන්ගේ මතයයි. මෙය මේ වන විටත් බරපතළ සමාජ ගැටලුවක් බවට පත්ව ඇත. සිසුන් තුළ කියවීමේ පුරුද්ද නැවත ඇති කිරීම දෙමාපියන් සහ ගුරුවරුන් සතු කාර්ය භාරයකි. කියවීමේ පුරුදු නැවත ඇති කිරීම මගින් පුද්ගලයෙකුට සමාජයේ ජීවත් වීම මෙන් ම ක්‍රියාකාරී පුද්ගලයෙකු ලෙස සමාජගත කිරීම පහසුවෙන් කළ හැකි ය.

(ආ) පැරණි ගැමි ජනතාව විවිධ වෘත්තීන්හි නියැලෙද්දී තම පාළුව, මහන්සිය, කාන්සිය මගහරවා ගැනීම සඳහා තම මුවින් ඉබේම නිකුත් වූ කවියක් ගයන්නට පුරුදුව සිටියහ. ඔවුන්ගේ නිදහස් සිතුවිලි මගින් තම ජීවිතයේ විවිධ අංශ විසිතුරු ලෙස විවරණය කරයි. අපේ සාහිත්‍යයේ ඉදිරි ගමනට ජනශ්‍රැති මගින් ලැබිය හැකි ආභාසය අතිමහත් ය.

(ඉ) සුවඳ විහිදුවා පිපෙන මල සේ ම ගසින් වියළී සුළඟට හසු ව පාවී යන කොළය ද සුන්දර පරිසර රටාවකි. එම පරිසර රටා සජීවී ව අඛණ්ඩ ව සුන්දර ව පවතින්නට නම් මිනිස් දෑත අකාරුණික ව පරිසරයට මැදිහත් නොවිය යුත්තේ ය. එවිට අතීත මිනිසා දිවි ගෙවූ සුන්දර මිහිකලය අනාගත පරපුරටද ලැබිය හැක්කේ ය. පරිසරයට එරෙහි මිනිස් ක්‍රියාකාරකම් පිටු දකිමු.

(ඊ) ශ්‍රී ලංකාවේ අපරාධ රැල්ල දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. දරුවන් විසින් තම දෙමාපියන් ඝාතනය කිරීමත්, පියා විසින් සිය දරුවන් ඝාතනය කිරීමත් දක්වා මෙය වර්ධනය වී තිබීම භයංකාර හා ජුගුප්සා ජනක ය. සියලු ම ආගම් මගින් පුද්ගලයන්ට යහගුණදම් කියා දුන්නත් මිනිසුන් ඒ අනුව ජීවිත හැඩගස්වාගෙන තිබෙන බවක් දක්නට නැත. යහපත් සමාජයක් ගොඩනැගීමට නම් නීතියේ අඩුපාඩුකම් දුරලීම ද අත්‍යවශ්‍ය වේ.

*(ලකුණු 25)*

03. පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග යොදන්න.

මිනිසුන් හා බොහෝ දුරට සමාන වානර වර්ග දෙකොටසක් වෙති. මානව-වානර වශයෙන් එක් කොටසක් හැඳින්විය හැකි ය. ඔවුන්ගේ අස්ථි පඤ්ජරය සම්පූර්ණයෙන් ම මිනිසුන්ගේ අස්ථි පඤ්ජරය හා සමාන ය. වෙන් වෙන් වශයෙන් බලතත් ඇටයක් පාසා ම ඒකාකාර ය. ගතිපැවතුම් වශයෙන් ද ඔවුන් අතර බොහෝ සමානකම් තිබේ. මිනිසුන්ට වැලඳෙන රෝග ඔවුන්ට ද වැලඳේ. මිනිසුන්ගේ ලේ වර්ගය ද ඔවුන්ට ඇති නමුත් ඔවුන්ගේ මොළයේ ප්‍රමාණය ඉතා කුඩා ය. ඔවුන්ට හිස කෙළින් ඔසවාගෙන ඇවිදීම කළ නොහැකි ය. කථා කිරීමට නුපුළුවන. ගිනි නිපදවීම ගැන ඔවුන්ට දැනුමක් නම් කොහෙත් ම නැති බව කවුරුත් දනිති. ඔවුන් අතර මූලික හුළු සාමාජික සිරිත් ඇතත් ඒවා මිනිස් ගතිවලට වැඩි සමානකමක් ඇතැයි නොසිතිය යුතුයි. මේ වර්ගයට ඇතුළත් වන්නෝ අප්‍රිකාවේ වසන ගෝරිල්ලා හා මලයා දේශයේ වසන චිම්පන්සි, ඔරං උටන් යන සත්ත්වයෝ ය.

අනෙක් වානර වර්ගයා සාමාන්‍ය වානර කොට්ඨාසවලට ගැනෙන වඳුරු ජාති ය. මොවුහු ද වලිගා සහිත කොටසක් ද වලිගා රහිත කොටසක් ද කියා ප්‍රධාන දෙකොටසක් වෙති. මේ දෙකොටස පැරණි ලෝකයට අයත් වර්ගය හා අලුත් ලෝකයට එනම්, ඇමරිකාවට අයත් වර්ගය වශයෙන් බෙදා ඇත. දැනට ප්‍රකාශිත වී තිබෙන කරුණු අනුව මානව-වානර වර්ගයා මනුෂ්‍යයාගේ කිට්ටු නෑදෑයින් හැටියට පිළිගන්නට වී තිබේ. ඔවුන්ට ඇතැම් විට දැක බිම නොගා කකුල් දෙකෙන් ගාට ගාටා වාගේ යා හැකි ය. මොළය විශාල වී දියුණු නොවූවත් එය තරමක් තිබෙන බව පිළිගත යුතු ය.

*(ලකුණු 10)*

**04.** පහත දැක්වෙන ඡේදය කියවා ඒ සමග ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

පැරණි සිංහල ගම සංවිධානය වූයේ කෘෂිකර්මාන්තය ප්‍රධානතම ජීවනෝපාය කරගනිමිනි. එහි දී ස්වාමිපුරුෂයා මෙන් ම භාර්යාව ද මෙම ආර්ථික චර්යාවට විශාල දායකත්වයක් ලබා දුන් බව පෙනේ. විශේෂයෙන් කාන්තාවගේ පැත්තෙන් බලන විට ගෘහීය කටයුතු පාලනය කර ගැනීම, පැළ සිටුවීම, වල් නෙළීම, අස්වනු නෙළීම, අස්වැන්න වේලා ගබඩා කර ගැනීම ආදී කාර්යභාරයන් රැසක ඇය නියුක්ත වූ බව පෙනේ. මෙහි දී වඩාත් වැදගත් කාරණයක් වන්නේ දේපළ උරුම වූ ආකාරය විමසා බැලීමයි. එය තීරණය වූයේ විවාහ ක්‍රමය මතයි. දීග විවාහයක දී පිරිමින් දෑවැද්දක් සමග ස්ත්‍රියක සරණ පාවා ගත් අතර, නිශ්චල දේපළවලට උරුමකම් කියන ලද බව පෙනේ. බින්න විවාහයක දී ස්ත්‍රිය මෙම දේපළවලට උරුමකම් කියූ අතර එහි දී පිරිමියාට දීග විවාහයක දී මෙන් දේපළවලට අයිතිවාසිකමක් හිමි නොවී ය. පොදුවේ බින්න විවාහය ජනප්‍රිය නොවුණ ද ඒ කෙරෙහි ඇතැම් සමාජ ආකල්ප ගොඩ නැගුණ ද සාම්ප්‍රදායික ලාංකික සමාජයේ බින්න විවාහය යම් ප්‍රමාණයකට හෝ ක්‍රියාවට නැගුණ බව පෙනේ. මෙයින් පැහැදිලි වන්නේ කාන්තාවගේ සමාජ තත්ත්වය හා කාර්ය භාරය පවතින සමාජ සංස්කෘතික හර පද්ධතීන්ට අනුව තීරණය වන බවයි. දෑවැද්ද ස්ත්‍රී පාර්ශවයෙන් ලබා දිය යුත්තක් වුවත් එමගින් නව පවුල් ඒකකයේ ආර්ථික සමබරතාව ආරක්ෂා කරනු ලැබී ය.

1. කාන්තාව නියුක්තව සිටි කාර්ය භාරයන් මොනවා ද ?
2. මෙ පාඨයේ ඇතුළත් විවාහ ක්‍රම දෙක කවරේ ද ?
3. පැරණි සිංහල ගම් සංවිධානයේ දී ඉස්මතු වී පෙනෙන විශේෂතාව කුමක් ද ?
4. විවාහයෙන් පසු දේපළ අයිතිවාසිකම් අතින් කාන්තාවට හා පුරුෂයාට හිමි වූ විශේෂ වරප්‍රසාද කවරේ ද ?
5. දෑවැද්ද මගින් පවුල් ඒකකයට සැලසුණු යහපත කුමක් ද ?

*(ලකුණු 10)*

**05.** පිළිමතලාව, ධීරානන්ද විද්‍යාලයේ කලා උළෙල **2024** සැප්තැම්බර් **14** වන දින පෙ.ව. **9.00** සිට ප.ව.**12.30** දක්වා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට විද්‍යාලයේ කලා සංගමය තීරණය කර ඇත. ඒ සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර හා වේදිකා ආලෝක පහසුකම් ඉල්ලමින් පිළිමතලාව "මිගාර සවුන්ඩ්ස්" ආයතනයේ කළමනාකරුට යවන ලිපිය ලියන්න. ඔබ කලා සංගමයේ ලේකම් උදිත හේරත් යැයි සිතන්න.

නැතහොත්

හිරුණි දිසානායක ශිෂ්‍යාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ යටගම නම් ග්‍රාමයේ, දුටුගැමුණු කනිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබා සාමාන්‍ය පෙළ විභාගය උසස් ලෙස සමත් වෙයි. ඇයගේ පියා ජීවතුන් අතර නොමැති අතර ස්ථිර රැකියාවක් නොමැති මව දැඩි ආර්ථික අපහසුතා මැද උසස් පෙළ සඳහා ඇය නගරයේ පාසලකට ඇතුළත් කරයි. උසස් පෙළ විභාගයට පෙනී සිටි ඇය අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලා අංශයෙන් ප්‍රථම ස්ථානයට පත් වූයේ කිසිවකු නොසිතූ ලෙසිනි.
මෙම සිදුවීම ඇසුරින් විශේෂාංග ලිපියක් සකස් කරන්න. (ලකුණු 15)

Learning Resource Center
R
De Mazenod College
Kandana

REGISTRAR
De Mazenod College
Kandana.

2024

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024

## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය : ................................ නම : ................................

| 10 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 02 යි. |
|---|---|---|

Learning Resource Center
R
De Mazenod College
Kandana

උපදෙස්
* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
* 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "ඒ වී මා ඇල්වූ සේ ඉතා නපුරු' යි මම ලජ්ජාවට පැමිණියෙමි"
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද ?
(ආ) එය ශ්‍රවණය කළේ කවරෙක් ද ?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

"නොගොසින් සිට සිටි වන      නිබඳේ යා
වෙසෙසින් සුර නර සෙත් නො      මඳේ යා
(අ) ..............................................................
(ආ) .............................................................."

(iii) "පුත එයිත් මට කියාද ගන්නේ ? ඇර ගන්ව"
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද ?
(ආ) මෙහි එයිත් යනුවෙන් ප්‍රකාශ කරන දෙය කුමක් ද ?

(iv) (අ) තේරවිලි කවි යොදා ගත්තේ කුමක් සඳහා ද ?
(ආ) කෙළි සෙල්ලම් ඇසුරෙන් නිර්මාණය වූ ජනකවි වර්ගයක් නම කරන්න.

(v) "කෙළින් කටින් සිටින්නට පුළුවන්කම තිබෙන තුරු ඔවුහු තමන්ගේ කොටස ඉටු කළ යුත්තාහු ය."
(අ) මෙම කොටස උපුටාගත් නිර්මාණයේ නම ලියන්න.
(ආ) එම නිර්මාණය සඳහා පාදක කරගත් දිස්ත්‍රික්කය කුමක් ද ?

(vi) අප බෝසතුන්      මිස
අනෙකකු නොම අසන      ලෙස
__සුරරජ__ සිට      අහස
..............................................
(අ) මෙහි අවසාන පදා පේළිය සම්පූර්ණ කරන්න.
(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදයේ අර්ථය ලියන්න.

(vii) "ලෙඩට බෙත් කොච්චර තිබුණත් කරුමෙට බෙත් තියෙනවා යැ?"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය කවුද ?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?

(viii) "මඟ අසබඩ කෙතක් රකිනා සිංහල කාන්තාවක ජාති ජරා මරණ ආදිය පිළිබඳ ව සිංහල බසින් කී ගීයක් අසා සඟ සැටනමක් රහත් වූහ."

(අ) මෙම අදහස සඳහන් වන අට්ඨ කතාව කුමක් ද ?

(ආ) එය ලියවුණු සාහිත්‍ය යුගය කුමක් ද ?

(ix) (අ) ජාතක පොත සිංහලයට නැඟුණු පසුව ද වෙන් වෙන් වශයෙන් ජාතක කතා ලියවී ඇත. උම්මග්ග ජාතකය ඉන් එකකි. එවැනි තවත් ජාතක කතාවක් නම් කරන්න.

(ආ) ජාතක කතා පොතට මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක් ද ?

(x) "වෙර නැකිදා ගහගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති කුග කොහේ කොටන්ට ද"

(අ) මෙම ජනකවිය අයත් වන ජනකවි විශේෂය කුමක් ද ?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත වචනයේ අර්ථය ලියන්න.

*(ලකුණු 2×10=20)*

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "පුංචි මැණිකාගේ බඩගින්නට හා කොහෙට්ටුවට ද මහල්ලාගේ කතාවෙන් උපන් සන්තාපයත් දුකක් එකතු විය."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) ඇය මෙසේ සන්තාපයට හා දුකට පත්වීමට හේතුව කුමක් ද ?

(ii) 'යොදා සවන් වෙණ නද රස සුලබව
නදා එකඟ සිත් වත නොම සකොබව
සදා කුලය නොහැර ම එන අසුබව
එදා ගියේ රිළවුන් සන්සල බව

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iii) "යහපත ආචාරිනි, තොප කී ලෙසම කෙරෙමි"

(අ) මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද්දක් ද ?

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
අමුතු බත් දිම අත ඇල්ලුමෙන් දැනේ
හානා හිය පානා අඩහැරෙන් දැනේ

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) සමස්ත කවියේ අදහස සරල බසින් ලියන්න.

(v) "ඉක්බිති රජ්ජුරුවනට මහ බෝසතාණන් වහන්සේ හැට යොදුන් රන්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහ රාජයකු මෙන් 'නොබව මැනැව, දේවයන් වහන්ස....''

(අ) මෙහි සඳහන් උපමාව ලියා දක්වන්න.

(ආ) මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ලකුණු 4×5=20)

03.
- බෝසත් චරිතය උසස් කොට දැක්වීමත්
- බමුණු සමාජය උපහාසයට ලක් කිරීමත්

උම්මග්ග ජාතකය තුළ දැකිය හැකි ලක්ෂණයකි. උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

- උපදේශ ලබා දීමත්
- සමාජයේ දුර්වලතා පෙන්වා දීමත්

තුළින් ජන කවිය ප්‍රබල සමාජ මෙහෙවරක් ඉටු කරයි. නිර්දිෂ්ට ජන කවි ඇසුරින් උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

04. ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට කතුවරයා යොදාගත්
- වියත් වහර
- සරල බස් වහර

එක සේ බලපා ඇති ආකාරය එක් කොටසකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

බැද්දේගම නව කතාවෙහි එන පුංචි මැණිකාගේ චරිතය
- දිරිමත් සිතක් ඇති ගැහැනියක් ලෙසත්
- පාඨක අනුකම්පාවට ලක්වන අහිංසක චරිතයක් ලෙසත් නිරූපණය කර ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසුමට ලක් කරන්න.

- 5, 6, 7 ප්‍රශ්නවලින් <u>එකකට</u> පමණක් උත්තර ලියන්න.

05. ගුත්තිල කාව්‍යය තුළ අතිශයෝක්ති වර්ණනා බහුල ය. උදාහරණ තුනක් ඇසුරින් විමසන්න.

(ලකුණු 10)

06. අවස්ථාවට උචිත සේ සංවාද යොදා ගනිමින් පාඨකයන් ඇද බැඳ තබා ගැනීමට බැද්දේගම කතුවරයා දැක්වූ කුසලතාව උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10)

07. ජන කවියේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ උපදෙස් කවි තුළ ද දැකිය හැකි ය. නිදසුන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

REGISTRAR
De Mazenod College
Kandana.